# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1636/10 – 2010 ජනවාරි 13 වැනි බදාදා – 2010.01.13

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ජේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: 4/1/ඉඅත්/59/2007.
ඉඩම් හා ඉඩම් සං. අමා. යොමු අංකය: LD/05/2007/(WS/341).

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳු පළාත කෝරලේ සුළු කොට්ඨාසයේ කුරුකුත්තල ඉහළ (117) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2009.12.17 දිනැති අංක මූ.පි. මහ 6057 පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන දෙහිගහයටතැන්නේ හේන නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0080ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

කැබලි අංක 1 – දෙහිගහයටතැන්නේ හේන – ප්‍රමාණය: හෙක් 0.0080

උතුරට: මූ.පි. මහ 5964හි කැබලි අංක 1 සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය සහ එම්. එස්. ඒ. කරීම් හිමිකම් කියන දෙහිගහයටතැන්නේ හේන; බටහිරට: මූ.පි. මහ 5964හි කැබලි අංක 1.

හිමිකම් කියන අය: එස්. එම්. එස්. රාසික්, අංක 59, නුවර පාර, වෙලම්බොඩ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2010. මාර්තු මස 03 වැනි දින පූ. භා. 10.00ට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 පෙබරවාරි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

පසන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2009 දෙසැම්බර් මස 23 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.
මහනුවර

01 - 789